# <u>මධ්‍යම පළාත් කලා උළෙල-2024</u>

**සංගීත කලායතන තරග**

මධ්‍යම පළාත් කලා උළෙලට සමගාමීව මධ්‍යම පළාත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සංගීත කලායතන අතර ගායන තරග හා වාදන තරග පහත අයුරින් පැවැත්වීමට තීරණය කර ඇත. එම තරග අදියර දෙකක් යටතේ ගායන තරග කනිෂ්ඨ අංශය හා ජ්‍යෙෂ්ඨ අංශය වශයෙන් පැවැත්වෙන අතර වාදන තරග විවෘත අංශය වශයෙන් පැවැත්වේ.

1. කලායතන මට්ටම (ප්‍රථම අදියර)
2. පළාත් මට්ටම (දෙවන අදියර)

**01. <u>කනිෂ්ඨ ජන ගායනා ඒකල :-</u>**

කනිෂ්ඨ තරග අංශය සඳහා කලායතන මට්ටමින් තරග පවත්වා ප්‍රථම ස්ථානය ලබා ගන්නා ජයග්‍රාහකයා පමණක් පළාත් තරගය සඳහා ඉදිරිපත් කළ යුතුය. ඒ අනුව කනිෂ්ඨ ජන ගායනා තරග සඳහා එක් කලායතනයකින් ඉදිරිපත් විය හැක්කේ එක් තරගකරුවෙකුට පමණි. කාන්තා, පිරිමි දෙඅංශයටම තරගය සඳහා ඉදිරිපත් විය හැකිය.

මෙම තරගය සඳහා පහත සඳහන් ජන ගී වර්ග වලින් එක් ගීතය බැගින් තෝරාගෙන ජන ගීත 03ක් ඉදිරිපත් කළ යුතුවේ.

**ජන ගායනා වර්ග :-**

i. සේගී - ප්‍රශස්ති ගී, වන්නම් ගී, වැලපුම් ගී සහ සංදේශ කාව්‍ය මේ වර්ගයට අයත්ය.

ii. සමාජ ගී - කෙළි ගී, නැලවිලි ගී, විරිඳු පුවත් ගී මේ වර්ගයට අයත්ය.

iii. මෙහෙ ගී - ගොයම් කැපුම් ගී, නෙළුම් ගී, ගැල් ගී, පැල් ගි සහ පාරු ගී මේ වර්ගයට අයත්ය.

**තරගයට අදාළ කොන්දේසි**

i. ගීතයට ගතවෙන කාලය ඒ සඳහා යොදාගත හැකිය.

ii. තරගකරු සමඟ වාදනය සඳහා සහභාගි විය හැකි උපරිම සංඛ්‍යාව 05 දෙනෙකි.

iii. ජන ගී ශෛලියේ අනන්‍යතා ලක්ෂණ සුරැකෙන සේ ගායනය හා උචිත වාදන ශිල්පක්‍රම යොදාගත හැකිය.

iv. පටිගත කළ සංගීතය, සහ විද්‍යුත් සංගීත භාණ්ඩ යොදා ගත නොහැකිය.

v. ශෛලියට ගැළපෙන සේ ප්‍රාසාංගිකව ඉදිරිපත් කළ යුතුය.

**02. <u>සමූහ ජන ගායනා විවෘත</u>**

සමූහ ජන ගායනා තරග අංශය සඳහා කලායතන මට්ටමින් තරග පවත්වා ප්‍රථම ස්ථානය ලබා ගන්නා ජයග්‍රාහී කණ්ඩායම පමණක් පළාත් තරගය සඳහා ඉදිරිපත් කළ යුතුය. ඒ අනුව සමූහ ජන ගායනා තරග සඳහා එක් කලායතනයකින් ඉදිරිපත් විය හැක්කේ එක් කණ්ඩායමකට පමණි. කාන්තා, පිරිමි දෙඅංශයටම තරගය සඳහා ඉදිරිපත් විය හැකිය. මේ සඳහා පහත සඳහන් දේශභිමාන ගීත අතරින් ගීතයක් ගායනයට අවස්ථාව ලබා දේ.

i. පණ්ඩිත් අමරදේව ශූරීන් ගායනා කරන

රත්නදීප ජන්මභූමි - ලංකා දීප විජය භූමි .................... ගීතය

ii.. ආචාර්ය වික්ටර් රත්නායක මහතා ගායනා කරන

රූවත් නිදන හෙළබිමයි - නුවන් අදන හෙළබිමයි. ........................... ගීතය..

iii. ප්‍රවීණ ගායන ශිල්පි ලතා වල්පොල මහත්මිය ගායනා කරන

ශ්‍රීනි විභූෂිත ලංකා බැබලේ - සිංහ ධජය සෙවනේ .................... ගීතය

**තරගයට අදාල කොන්දේසි**

i. ගීතයට ගතවෙන කාලය ඒ සඳහා යොදාගත හැකිය.

ii. තරගය සඳහා සහභාගී විය හැකි උපරිම සංඛ්‍යාව වාදනයද සමග 15

iii. වාද්‍ය භාණ්ඩ 05 ක් මේ සඳහා යොදාගත හැකි අතර පටිගත කළ සංගීත, විද්‍යුත් සංගීත භාණ්ඩ යොදාගත නොහැකිය.

iv. අදාළ ගීතවල ශෛලියේ අනන්‍යතා ලක්ෂණ සුරැකෙන සේ ගායනය හා උචිත වාදන ශිල්පක්‍රම යොදාගත හැකිය.

iv. ශෛලියට ගැලපෙන සේ ප්‍රාසාංගිකව ඉදිරිපත් කළ යුතුය.

## <u>03. විවෘත වාදන තරග ගී අනු වාදන ඒකල :-</u>

විවෘත අංශයේ වාදන තරගය සඳහා ද කලායතනයකින් ඉදිරිපත් විය හැකි වනුයේ එක් තරගකරුවෙකුට පමණි. මෙම තරග සඳහා පිරිමි හෝ කාන්තා භේදයකින් තොරව තරගයට ඉදිරිපත් විය හැකිය.

i. ස්වර පුවරු භාණ්ඩ හැර වෙනත් ඕනෑම ස්වර වාද්‍ය භාණ්ඩයක්න්ගෙන් ඉදිරිපත් කළ හැකිය.

ii. තරගකරු සමග වාදනය සඳහා සහභාගිවිය හැකි උපරිම සංඛ්‍යාව 06 දෙනෙකි.

iii. ජන ගී නාදමාලා ආභාසයෙන් නිර්මාණය වූ සරල ගීයක් වාදනය කළ යුතුය.

iv. ගීතයට ගතවෙන කාලය ඒ සඳහා යොදාගත හැකිය.

**පොදු තරග කොන්දේසි : -**

1. මධ්‍යම පළාත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කලායතනවල සිසු සිසුවියන්ට පමණක් ඉදිරිපත් වීමට හැකිය.

2. මෙම තරග කනිෂ්ඨ ජන ගායනා ඒකල, සමූහ ජන ගායනා විවෘත, ගී තනු වාදන විවෘත වශයෙන් තරග කාණ්ඩ 03ක් යටතේ පැවැත්වේ. කණිෂ්ඨ අංශය වයස අවු. 12-15ත් අතර හා විවෘත අංශයට වයස අවුරුදු 18-25 ත් අතර වයස් සීමාවේ කලායතනයේ ඉගෙනුම ලබන අයට මෙම තරග සඳහා ඉදිරිපත් වීමට අවස්ථාව ඇත. සහය වාදනය සඳහා කලායතනාධිපතිටද ඉදිරිපත් වීමට අවස්ථාව ඇති අතර වාදනයට නියමිත සංඛ්‍යාව ඉක්මවා නොයන පරිදි කටයුතු කළ යුතුය.

3. වයස් සීමාව ලෙස පිළිගනු ලබන්නේ 2024-08-15 වන දිනට ඉහත අංක 02හි සඳහන් පරිදි වයස සම්පූර්ණ වී තිබීම. පළාත් තරගයට ඉදිරිපත් වීමේදී උප්පැන්න සහතිකය ඉදිරිපත් කළ යුතු වේ.

4. ජන ගී හා සරල ගී වලට උචිත තාල වාද්‍ය භාණ්ඩ හා ස්වර භාණ්ඩ වාදනය කළ යුතුය. ස්වර භාණ්ඩ වශයෙන් වයලීනය, එස්රාජය, සර්පිනාව හා බටනලාව යොදා ගැනීම ප්‍රමාණවත්ය.

5. නියමිත නාද රටාව අනුව ගායනා කිරීම අනිවාර්ය වේ. වාදනය සඳහා විද්‍යුත් වාද්‍ය භාණ්ඩ භාවිතා කළ නොහැක.

6. ගායනයට බාධාවක් නොවන සේ අවශ්‍ය පරිදි අංග චලනය ඉදිරිපත් කළ හැකිය.

7. පළාත් මට්ටමේදී ගායනයට උචිත ප්‍රසාංගික ඇඳුමක් සහ වාදක මණ්ඩලයට ගැලපෙන පරිදි ඇඳුම් සකස් කර ගත හැකිය.

8. පළාත් මට්ටමේ තරග සඳහා කැඳවීම් කරනු ලබන්නේ අයදුම්පත් ඉදිරිපත් කළ අයට පමණි.

9. මේ සඳහා ඉදිරිපත්වන අයදුම්පත් සංඛ්‍යාව අනුව මෙම දෙපාර්තමේන්තුව මගින් එක් ස්ථානයකදී පළාත් තරග පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. එසේම ප්‍රවීණ විනිශ්චය මණ්ඩලයක් මගින් ගායන හා වාදන තරග විනිශ්චය කරන අතර විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

10 ප්‍රථම, දෙවන, හා තෙවන ස්ථාන සහ කුසලතා ස්ථාන ලබා ගන්නා කලායතන සඳහා මුදල් ත්‍යාගද තරගයට ඉදිරිපත් වන දරුවන් සඳහා සහතික පත්‍රයක් ලබා දීමට කටයුතු කරනු ලැබේ.

11. ජයග්‍රාහී ගායනා පළාත් කලා උළෙලේදී ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් පළාත් අධ්‍යක්ෂ විසින් තීරණය කරනු ඇත. තරග පැවැත්වීම පිළිබඳ පළාත් සංස්කෘතික අධ්‍යක්ෂකගේ තීරණය අවසාන තීරණය බව කරුණාවෙන් සලකන්න

12. අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනය 2024 මැයි මස 15 වන දින වේ. මෙම තරගයන් පිළිබඳ වැඩි විස්තර පහත සඳහන් ලිපිනයෙන් හා මධ්‍යම පළාත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය www.culture.cp.gov.lk මගින් ද ලබාගත හැකි බව කාරුණිකව සලකන්න. සියලුම කලායතන අයදුම්පත් අදාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සංස්කෘතික නිලධාරී වෙත නියමිත දිනට ප්‍රථම භාර දිය යුතු වේ.

විමසීම් : 0812238476

ටී.එම්. ඉනෝදනී තඹවිට,
පළාත් අධ්‍යක්ෂ,
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව,
මහනුවර

## සංගීත කලායතන තරග අයදුම්පත්‍රය

දිස්ත්‍රික්කය [ ] ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය [ ]

1. කලායතනයේ නම: - ..............................................................................

2. කලායතනාධිපතිගේ නම :- ..............................................................................

   i. කලායතනාධිපතිගේ ලිපිනය :- ..............................................................................

3. තරගයට ඉදිරිපත් වන අයදුම්කරුගේ නම :- ..............................................................................

..............................................................................

4. ඉදිරිපත් වන තරග අංශයඃ- කණිෂ්ඨ ජන ගායනා අංශය /විවෘත ජන ගායනා / විවෘත ගී තනු වාදන

   i. ලිපිනය :- ..............................................................................

   ii. ස්ථාවර දුරකථන අංකය :- .............................. .ජංගම දුරකථන අංකය. :- ..............................

   Email ලිපිනය :- ..............................................................................

5. වාදන සහ සමූහ ගායනා තරග සඳහා සහභාගිවන සිසු/ සිසුවියන්ගේ නාම ලේඛනය :-

| අනු අංකය | මුලකුරු සමග නම |
|---|---|
| 01. | |
| 02.. | |
| 03. | |
| 04. | |
| 05. | |
| 06. | |
| 07. | |
| 08. | |
| 09. | |
| 10. | |
| 11. | |
| 12. | |
| 13. | |
| 15. | |

6. මධ්‍යම පළාත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ කලායතනය ලියාපදිංචි අංකයඃ } [ ]

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් ඉදිරිපත් කරනු ලබන අයදුම්කරු මාගේ කලායතනයේ ඉගෙනුම ලබන සිසුවෙක් /සිසුවියක් බවට සහතික කරන අතර. තරගයේ සියලුම කොන්දේසි හා නීති රීතිවලට අනුකූලව කටයුතු කිරීමට එකඟ වන බවත් විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය බවත් පිළිගනිමි.

.............................................. ..............................................

දිනය කලායතනාධිපතිගේ අත්සන

නිල මුද්‍රාව

සංස්කෘතික නිලධාරිගේ නිර්දේශය :-

ඉහත නම් සඳහන් තරගකරු .............................. දිස්ත්‍රික්කයේ .............................. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ .............................. කලායතනයේ ඉගෙනුම ලබන ශිෂ්‍යයෙක්/ ශිෂ්‍යාවක් බවත් චක්‍රලේඛයට අනුව මෙම තරගය සඳහා සුදුසුකම් ලබා ඇති බවත් සහතික කරමි.

.............................................. ..............................................

දිනය සංස්කෘතික නිලධාරිගේ අත්සන

නිල මුද්‍රාව

**ජයග්‍රාහී තරගකරුවන් ඇගයීම**

| අනු අංකය | තරග අංශය | ස්ථානය | ත්‍යාගයේ වටිනාකම |
|---|---|---|---|
| 01. | කනිෂ්ඨ ජන ගායනා තරගය | ප්‍රථම ස්ථානය<br><br>දෙවන ස්ථානය<br><br>තෙවන ස්ථානය<br><br>කුසලතා ස්ථාන 02 **x** 2000.00 | රු. **5000.00**<br><br>රු. 4000.00<br><br>රු. **3000.00**<br><br>රු. 4000.00 |
| 02. | ජ්‍යෙෂ්ඨ ජන ගායනා තරගය | ප්‍රථම ස්ථානය<br><br>දෙවන ස්ථානය<br><br>තෙවන ස්ථානය | රු. **5000.00**<br><br>රු. 4000.00<br><br>රු. **3000.00** |

| | | | |
|---|---|---|---|
| | | කුසලතා ස්ථාන 02 x 2000.00 | රු. 4000.00 |
| 03. | විවෘත වාදන තරගය | ප්‍රථම ස්ථානය<br><br>දෙවන ස්ථානය<br><br>තෙවන ස්ථානය<br><br>කුසලතා ස්ථාන 02 x 2000.00 | රු. 5000.00<br><br>රු. 4000.00<br><br>රු. 3000.00<br><br>රු. 4000.00 |